ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

**සන්නිවේදන දෙපාර්තමේන්තුව**
**30,** ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
දුරකථන අංක **: 2477424, 2477423, 2477311**
ෆැක්ස්**: 2346257, 2477739**
ඊ-මේල්**: dcommunications@cbsl.lk, communications@cbsl.lk**
වෙබ් අඩවිය**: www.cbsl.gov.lk**

# පුවත්පත් නිවේදනය

| | |
|---|---|
| නිකුත් කළේ | විනිමය පාලන දෙපාර්තමේන්තුව |
| දිනය | 2016 අප්‍රේල් 22 |

## ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද භාණ්ඩ සඳහා ලද ගෙවීම් නැවත මෙරටට රැගෙන ඒම

රට තුළට විදේශ විනිමය ගලා ඒම වැඩිදියුණු කිරීම සඳහා වර්තමානයේ ගනු ලබන ප්‍රතිපත්තිමය පියවරයන්හි කොටසක් වශයෙන්, ගරු මුදල් අමාත්‍යවරයා විසින් පහත කරුණු අඩංගු අංක 1960/66 දරන 2016 අප්‍රේල් 01 දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය නිකුත් කර ඇත.

i. ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන භාණ්ඩ සඳහා ගෙවීම් කිරීම සම්බන්ධයෙන් 1993 මාර්තු 26 දිනැති අංක 759/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රයෙන් ලබා දී තිබූ නිදහස් කිරීම අවලංගු කිරීම.

ii. 2016 අප්‍රේල් 01 දින වන විට ශ්‍රී ලංකාවෙන් පිටත රඳවා ගෙන ඇති එවැනි ඕනෑම ගෙවීමක් 2016 මැයි 01 දිනට පෙර ශ්‍රී ලංකාවට රැගෙන ඒම අනිවාර්ය කිරීම.

iii. 2016 අප්‍රේල් 01 දින හෝ ඉන්පසුව ලැබෙන එවැනි ඕනෑම ගෙවීමක්, භාණ්ඩ අපනයනය කිරීමේ දින සිට දින 90 ක් ඇතුළත ශ්‍රී ලංකාවට රැගෙන ඒම අනිවාර්ය කිරීම.

මෙම ඉපැයීම් බලයලත් වාණිජ බැංකුවක, දේශීය බැංකු ඒකකයක අපනයනකරුගේ නමින් පවත්වාගෙන යන ඕනෑම විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට බැර කිරීමට හෝ බලයලත් වාණිජ බැංකුවකට විකිණීම කළහැක.